www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**ඔබාමාගේ ඩිට්‍රොයිට් සංචාරය**

**Obama in Detroit**

# අපරාධය සිදුකල තැනට පෙරලා පැමිනීම

## Returning to the scene of the crime

2010 ජූලි 30

ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් මෝටර් රථ සමාගම්වලට ඇප දීමෙන් වසරක් ගත වෙන තැන මෝටර් කර්මාන්තය පියවි තත්වයට පැමින ඇතැයි හුවාදැක්වීම පිනිස සැලසුම් කොට තිබුන ඡායාරූප රංගනයකට සහභාගී වීම සඳහා ජනාධිපති ඔබාමා අද දින ඩිට්‍රොයිට්හි ප්‍රදේශ දෙකක සංචාරය කලේය. මහා අවපාතයෙන් මෙපිට අත් නොදුටු ආකාරයේ දීර්ඝ-කාලීන විරැකියාවක් අත්කරදී ඇති පාලානාධිකාරිය "ආර්ථික පුනර්ජීවනය" පිලිබඳ සාක්ෂියක් වසයෙන් මෝටර් රථ කර්මාන්තය යලි පිබිදීම හා සීමිත අනියම් රැකියා සම්පාදනයත් හුවා දක්වයි.

29 වැනි දින පැවති සම්මුඛ සාකච්ඡාවක දී සියලුම එක්සත් ජනපද රථවාහන නිෂ්පාදකයන් ලාභ පෙන්වා තිබීම පිලිබඳව ඔබාමා උදම්ඇනුවේය. "අපි මෝටර් රථ සමාගම්වල ආයෝජනය කල සියලුම මුදල් ආපසු ලබා ගන්නා තැනට සමීප වෙමින් සිටින්නෙමු," ඔහු කීවේය. මෝටර් රථ කර්මාන්තය, දශකයක් තුල වාර්තා කල විශාලම රැකියා සංඛ්‍යාව වන රැකියා 55,000ක් 2009 ජූනි මාසයේ සිට නිර්මානය කර ඇතැයි ජනාධිපති කියා සිටියේය. කෙසේවෙතත්, 615,000 ක්වූ මෙම ක්ෂේත්‍රයේ විනාශ කල මුලු රැකියා වලින් පසුගිය මාස 18 තුල යලි බිහිකොට ඇත්තේ සියයට 10කටත් අඩු ප්‍රමානයක්ය යන්න සඳහන් කිරීමට හෙතෙම අසමත් විය.

ජීඑම්හි ඩිට්‍රොයිට්-හැම්ට්‍රැම්ක් හා ක්‍රයිස්ලර්හි උතුරු ජෙෆර්සන් එකලස් කිරීමේ ශාඛාවන් වෙත ජනාධිපතිගේ පැමිනීම අපරාධය සිදුවූ ස්ථානයට පෙරලා පැමිනි අපරාධකරුවෙකුගේ ස්වාභාවයක් ඉසිලීය. මෝටර් රථ කර්මාන්තය යලි ලාභ ලැබීම පදනම්ව පැවතියේ කර්මාන්තය ම්ලේච්ඡ ලෙස හකුලා දැමීමෙන් හා කම්කරු පන්තිය සූරාකෑම තියුනු ලෙස ඉහල නැංවීමෙනි. වෝල්වීදියේ බලගතු අවශ්‍යතා වෙනුවෙන් ධවල මන්දිරය මෙම ප්‍රහාර වලට නියෝග දුන්නේය.

අලුතින් බඳවා ගත් ක්‍රයිස්ලර් ශාඛාවේ 1,300ද ඇතුලු කම්කරුවන්ට දැන් ගෙවනු ලබන්නේ වසර කීපයකට ඉහතදී වාහන කම්කරුවන් ඉපැයූ වැටුපෙන් අඩකි. ඩොලර් සිය ගනනක බදු සහ වෘත්තීය සමිති ගාස්තු ගෙවීමට පෙර ඔවුන් ලබන වාර්ෂික වැටුප වන ඩොලර් 28,000, සිව් දෙනෙකුගෙන් යුත් පවුලක් සඳහා ලබා දෙන ආන්ඩුවේ දිලිඳු දීමනාවට වඩා වැඩි වන්නේ යාන්තමිනි.

මෝටර් රථ කම්කරුවන්ගේ වීරයෙකු වනවාට වඩා ඔබාමා, ජීඑම් සහ ක්‍රයිස්ලර් රැකියා, වැටුප් හා සහනාධාර දරුනු ලෙස කැපීම පදනම් කරගනිමින් මුලින් ඉදිරිපත්කල යලි ගොඩප්මේ සැලසුම් අවශ්‍ය තරම් දුර ගොස් නැතැයි ප්‍රතික්ෂේප කලේය. හාම්පුතුන්ට වේදනාකාරී සහන සැලසීමට ඕනෑවටත් වඩා කැපකිරීම් කර ඇති කම්කරුවන්ගෙන් තව තවත් මිරිකා ගැනීම අවශ්‍ය කෙරෙන "ප්‍රධාන ප්‍රතිව්‍යුහගත කිරීම්" ගැන සඳහන් කරමින් සමාගම් ඒ සඳහා සූදානම් නැත්නම් ඒවා වසා දැමීමට ඔබාමා තර්ජනය කලේය.

එක්සත් මෝටර් රථ කම්කරු සමිතිය (යූඒඩබ්ලිව්) සමග ප්‍රවේශමින් කටයුතු කල පාලන තන්ත්‍රය දුසිම් ගනනක් වන කම්හල් වසා දමමින් ද දෛනික හා මාසික වැටුප් ගෙවූ ජීඑම්හි කම්කරුවන්ගේ රැකියා 31,000ක් අහෝසි කරමින් හා දිගු කාලීන මෝස්තර හා වෙලඳ නාම ඉවත් කිරීමට බලකෙරුනු "ක්‍රමානුකූල බංකොලොත් භාවයකට" මෝටර් රථ නිෂ්පාදකයන් දෙදෙනා ඇද දැමීය. මෙම කප්පාදුව සිය ගනනක් වන රථවාහන වෙලෙන්ඳන් වෙලඳසැල් වසාදමන තත්වයකට පත් කලේය. එක්සත් ජනපදයේ රථවාහන හා ඒ ආශ්‍රිත රැකියාවන්හි නිරත වූ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සහ කැනඩාවේ හා

යුරෝපයේ තවත් දහස් ගනනක් ද සමඟ රැකියා විරහිතයන්ගේ පෝලිම්වලට ඇද දැමීය.

ඔබාමා ගමන් කල මිචිගන්හි නිල විරැකියා අනුපාතය රටේ දෙවන නරකම අගය වන සියයට 13.2කි. 2010 වසරේ ප්‍රථම කාර්තුවේදී, ප්‍රාන්තයේ ආහාර සහනාධාරය ලැබූ පවුල් සංඛ්‍යාව 2009 වසරට සාපේක්ෂව සියයට 27කින් එනම් 29,000කට ආසන්න ප්‍රමානයකට ඉහල නැගුනි. ඩිට්‍රොයිට්හි සැබෑ විරැකියා අනුපාතය සියයට 50කි.

ඔබාමා පාලන තන්ත්‍රය විසින් හඳුන්වාදී ඇති සැලැස්මක කොටසක් වසයෙන් ඩිට්‍රොයිට්හි රජයේ පාසැල් දුසිම් ගනනක් වසා දමා ඇති අතර ප්‍රාන්ත නගරාධිපති ඩොලර් බිලියන 300ක් වන අයවැය පරතරය පියවනු වස් රාජ්‍ය සේවක වැටුප් කපා දැමීමටත් නගර සභාවේ සේවය ලැබීමට තරම් වත්පොහොසත්කම් නැති අවශේෂ ප්‍රදේශයන්හි සේවාවන් කපා දැමීමටත් සැලසුම් කරමින් සිටියි.

ඔබාමාට අනුව ආර්ථික පුනර්ජීවනය කියන්නේ මෙයයි.

සැබවින්ම නම් ඩිට්‍රොයිට්හි වාහන නිෂ්පාදකයෝ ලාභ වැඩිකරගත්හ. පලමු කාර්තුවේදී ඩොලර් බිලියන 1.2ක් ලාභ ඉපැයූ ජීඑම් සමාගම එහි ආන්ඩුවට අයත් කොටස් ප්‍රසිද්ධියේ විකිනීම මෙම වසර අවසානයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. අයිපීඕ සමාගම ඩොලර් බිලියන ගනනක් නොවේ නම් මිලියන සිය ගනනක් මෙම ගනුදෙනුව සහතික කිරීම සඳහා එක්සත් ජනපද භාන්ඩාගාරය විසින් තෝරාගත් වෝල් වීදියේ සමාගම් දෙක වන ජේපී මෝගන් චේස් හා මෝගන් ස්ටැන්ලි වෙත ගාස්තු වසයෙන් පිරිනමනු ඇත. මෙය එක්සත් ජනපද ව්‍යාපාරික ඉතිහාසයේ විශාලතම ගනුදෙනු වලින් එකක් වනු ඇත.

ආරම්භයේදී රථවාහන කර්මාන්තයට ඇපදීම, සැලසුම් කලේ මූල්‍ය ප්‍රභූව වෙත සහන පිරිනැමීම සඳහා ය. රථවාහන කාර්ය සාධක බලකාය මෙහෙයවීමට තෝරා ගත් පුද්ගලයින් දෙස බැලූ විට මෙය පැහැදිලි විය. මෝටර් රථ කර්මාන්තයේ පූර්ව අත්දැකීම් රහිත පෞද්ගලික දේපල වෙලෙන්දෙකු වන "රථවාහන සාර්" ස්ටීවන් රැට්නර් ඩොලර් මිලියන 600ක පෞද්ගලික වාසනාවකට හිමිකම් කියයි. ප්‍රධාන වසයෙන්ම අර්බුදයේ කිඳුනු සමාගම් "සූරාගෙන හා පැහැර ගෙන" එම ධනය ගොඩ ගසා ගත්තේය. දැනට ඔහු නිව් යෝර්ක් විශ්‍රාමික අරමුදලෙන් ලාභදායී ආයෝජන අත්කර ගැනීම පිනිස සන්තෝෂම් දීමනා ව්‍යාපෘතියක නියැලීමේ කාරනය මත සුරැකුම් හා හුවමාරු කොමිසමේ තහංචි වලට ලක්ව සිටියි.

මොවුහු විශ්‍රාමික කම්කරුවන්ගේ දන්ත හා දෘෂ්‍ය ආරක්ෂන උදුරා ගනිමින් ද වත්මන් කම්කරුවන් සඳහා පිරිනැමූ අතිකාල දීමනා හා වැඩ පොල තුල රක්ෂනය වලපල්ලට යවමින් ද ජීවන වියදම් දීමනා කපා දමමින් සහ වැටුප් කැටි කරමින් කම්කරුවන් "වේදනාකාරී සහන" පිලිගත යුතු බව කියා සිටින සමාජ පරපුට්ටන් වෙති.

සියල්ලටමත් වඩා, ඔබාමා පාලනාධිකාරිය සියලුම අනාගත කම්කරුවන්ගේ වැටුප්වල දරුනු හා අනවරත කප්පාදුවක් ඉල්ලා සිටියේය. මෙම ඉල්ලීම, "ප්‍රමුඛ-නොවන", එනම් නිෂ්පාදනයට දායක නොවන කම්කරුවන්ගේ වැටුප පැයකට (දැන් ගෙවන ඩොලර් 24සිට) ඩොලර් 14 දක්වා අඩු කිරීම පිලිගැනීමට යූඒඩබ්ලිව් සමඟ එලැඹි ගිවිසුම ඉක්මවා පුලුල් කර ඇත. ඔබාමා පරිපාලනය අවධාරනය කලේ සියලුම අලුත් කම්කරුවන් සඳහා පහත් වැටුප් අදාල විය යුතු බව ය. "එසේ කිරීමේදී පාලන තන්ත්‍රය වාහන නිෂ්පාදකයන් අඩුකිරීමට සැලසුම් කල වැටුප් මට්ටම් ද ඉක්මවා ගියේය," යනුවෙන් වොෂින්ටන් පෝස්ට් පුවත්පත වාර්තා කලේය. වාහන නිෂ්පාදකයන්ගේ අදහස් පිලිබඳව මැනවින් දන්නා හා සාකච්ඡා වලට සම්බන්ධව සිටි මූලාශ්‍රයක් ප්‍රකාශ කලේ "නිපැයුම්කරුවන්ගේ ආස්ථානයෙන් ගත්විට නිමැවුම් පේලිවල කම්කරුවන් සැමවිටම පැයකට ඩොලර් 28ක් ලබා ගන්නේය"යි සලකන ලද බවයි. කෙසේවෙතත් ධවල මන්දිරය "තරගකාරී වන අයුරින් සමස්තයක් වසයෙන් ශ්‍රම වියදම් අවම කිරීමේ ක්‍රමයක් ලෙස පැයකට ඩොලර් 14ක් ගෙවීමට" ඉල්ලා සිටියේ යැයි මෙම මූලාශ්‍රය වාර්තා කලේය.

දශක ගනනාවක් තිස්සේ මෝටර් රථ කම්කරුවන් දිනාගත් වැඩි වැටුප් සමස්ත කම්කරුවන්ගේම පොදු ජීවන තත්වයන් ඉහල නංවා තිබිනි. රථ වාහන කම්කරුවන් මත ප්‍රහාර එල්ල කිරීමත් සමගින් ඔබාමා පාලන තන්ත්‍රය සමස්ත ආර්ථිකයේම වැටුප්-කැපීම්වලට පූර්වාදර්ශය සැපයුවේය. අනවරතව පවත්වා ගන්නා ඉහල විරැකියා මට්ටම්, "පරිභෝජනයේ" පහල දැමීමක් හා නිර්යාත දෙගුන

කිරීමක් මත පදනම් කිරීමට නියමිත ආර්ථික "ප්‍රකෘතිය," අත්කර ගැනීමට නියමිතව ඇත්තේ ඇමරිකානු කම්කරුවන් මෙන්ම ආසියාව හා ලතින් ඇමෙරිකාවේ ම්ලේච්ඡ ලෙස සූරාකෑමට ලක් වන ඔවුන්ගේ සහෝදර කම්කරුවන් අතර වැටුප් පරතරය සම මට්ටමකට ගෙන ඒමෙනි.

පරම්පරා ගනනක කම්කරු පන්තික අරගලවලින් දිනාගනු ලැබූ ජයග්‍රහන අතුගා දැමීමේ සිය වෑයමේදී ඇමරිකානු පාලක පන්තිය යූඒඩබ්ලිව් සහ අනෙකුත් වෘත්තීය සමිති නිලධරයේ අඛන්ඩ සේවය මත ගනන් බලමින් සිටියි. මෙම වෘත්තීය සමිති දශක තුනකටත් වැඩි කාලයක් තිස්සේ සංගත හා ආන්ඩුවේ කම්කරු පොලිස්කාරයා ලෙස සේවය කොට ඇති අතර දැන් ඔවුහු මෝටර් රථ සමාගම්වල කොටස් වලින් සැලකිය යුතු ප්‍රමානයක් සතු කරගෙන සිටිති.

අභිනවයෙන් පත් වූ යූඒඩබ්ලිව්හි ප්‍රධානී බොබ් කින්ග් 29 වෙනිදා නිකුත් කල ප්‍රකාශනයකින් ෆෝඩ්, ක්‍රයිස්ලර් සහ ජීඑම්හි ලාභ වාර්තා කිරීම් පිලිබඳව අත්පුඩි තලමින් ඔබාමා පාලානාධිකාරියට හුරේ දැමුවේ, ඔවුන් "එක්සත්, සාමූහික සබඳතාවන්ගෙන් කල හැක්කේ කුමක්දැයි ප්‍රදර්ශනය කර තිබේ," යැයි කියමිනි.

මෝටර් රථ කම්කරුවෝ, ඔවුන් සූරාකෑමට බඳුන් කරන මෝටර් රථ සමාගම්වල මිලියනපති විධායකයින් හා වෝල් වීදියේ සමපේක්ෂකයන්ගේ පටන් ඔවුන්ගේ සාක්කුවට වැටී සිටින හා ඔවුන්ගෙන් වැටුප් ලබන ප්‍රධාන ව්‍යාපාරික පක්ෂ දෙකේම දේශපාලඥයින් හා යූඒඩබ්ලිව්හි දූෂිත ව්‍යාපාරික නිලධරයින් කෙරෙහිත් ගැඹුරින් මුල් බැසගත් වෛරයකින් පසු වෙති. වැඩි කල් නොයවා ම ඇමරිකානු කම්කරු පන්තියේ පන්ති සහයෝගිතාවේ හා අරගලයේ බලගතු සම්ප්‍රදායන් යලි පන ගන්වනු ඇති විරෝධය පෑමේ නව අරගල, විශේෂයෙන් මෝටර් රථ කම්කරුවන්ගේ නව පරම්පරාව තුලින් හට ගනු ඇත.

යූඒඩබ්ලිව් සමිතියට එරෙහිව සංවිධානය වූ අරගලයේ නව සංවිධාන ගොඩ නැගීමත් ඔබාමා පාලනාධිකාරියට, ප්‍රධාන ව්‍යාපාරික පක්ෂ දෙකට හා ඔවුන් විසින් ආරක්ෂා කරන ධනපති ලාභ පද්ධතියට එරෙහිව සටන් වැදීමට නැවුම් දේශපාලනික මූලෝපායක් හා වැඩ පිලිවෙලක් ඒ සඳහා අවශ්‍යය. එය පදනම් විය යුත්තේ ජාත්‍යන්තර රථ වාහන සමාගම් වලට එරෙහිව හා එක්සත් ජනපදය තුල මෙන්ම ජාත්‍යන්තරවත් රථවාහන කර්මාන්තය සමාජවාදී ලෙස පරිවර්තනය කරන හා සාමූහිකව පාලනය කරන මහජන ව්‍යවසායක් බවට පත් කිරීම වෙනුවෙන් සියලුම කම්කරුවන්ගේ ජාත්‍යන්තර එකමුතුව සඳහා කරන සටන මතය.

ජෙරී වයිට්

කතුවරයා පහත ලිපිය ද කියවීමට නිර්දේශ කරයිඃ

"ජීඑම් බංකොලොත් වීමේ සිට වසරක් ගතවෙයි"

© www.wsws.org